# වේවැල්කැටිය ශිලා ලේඛනයෙන් හෙළිවෙන පැරණි සමාජයේ දඬුවම් ක්‍රම

ඒ.එම්.එස්.යූ. රත්නපාල

පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. sanjeewakumara@gmail.com

ප්‍රමුඛ පදඃ වේවැල්කැටිය ශිලා ලේඛනය, පැරණි සමාජ ව්‍යුහය, නීතිය, දඬුවම් ක්‍රම

## හැඳින්වීම

වැරදි වීම මිනිස් ගතියක් ලෙස සමාජයේ පිළිගැනීම වන අතර හිතාමතා වැරදි කිරීම ඊට අදාල නොවේ. සමාජ සම්මතයන්ට පටහැනිව ක්‍රියා කිරීම එහි දී වරදක් ලෙස අර්ථවත් වේ. මිනිසා හිතාමතා සිදුකරන වැරදි අවම කිරීම හෝ වැළැක්වීම නීතියේ කාර්යභාරය වන අතර ඒ සඳහා සම්මත නීතිවලට අනුව දඬුවම උපක්‍රමයක් ලෙස භාවිත කරයි. දඬුවම කවදා කොතැනක කවුරුන් සඳහා කවුරුන් විසින් මුලින්ම භාවිත කළාදැයි නිශ්චිතව හඳුනාගත නොහැකිය. ලොව ඉපැරණි ම නිති සංග්‍රහය ලෙස සලකන හමුරාබි ප්‍රඥප්තිය තුළ එකළ පැවති දඬුවම් ක්‍රම සඳහන් ව ඇත. මනුස්මෘතිය නම් කෘතියෙහි අවවාද කිරීම, දඩ ගැසීම හා ශාරීරික දඬුවම් නියම කිරීම දැකගත හැකිය (මනුස්මෘතිය 1991, 129). ක්‍රි.පූ 06 වන සියවසෙහි බුද්ධකාලීන භාරතයෙහි පැවති දඬුවම් ක්‍රම පිළිබඳ ත්‍රිපිටක සාහිත්‍යයේ කරුණු අන්තර්ගත වේ. ඒ අනුව සොරකමට අදාළ දඬුවම් වූයේ කස වලින් තැලීම, අත් පා කැපීම, හිස මුඩු කිරීම, හුල හිඳුවීම හා හිස සිඳීම යනාදිය යි. වරදේ ස්වභාවය අනුව දඬුවම් කළයුතු බව එහි සඳහන් වේ. අප මෙහි දී විශේෂයෙන් අවධානය යොමු කරන වේවැල්කැටිය ශිලා ලේඛනයෙහි අන්තර්ගත වී ඇත්තේ ද අනුරාධපුර යුගයේ අවසාන සමයේ මෙරට ක්‍රියාත්මක වූ දඬුවම් ක්‍රම පිළිබඳවයි. ඒ පිළිබඳව කරුණු විමසීම මෙම අධ්‍යනය මඟින් සිදුවේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යනයේ දී සාහිත්‍යමය මූලාශ්‍ර පරිශීලනය කිරීම මූලිකව සිදුවේ. විශේෂයෙන් ම පැරණි දඬුවම් ක්‍රමවල ස්වභාවය හඳුනා ගැනීම සඳහා මහාවංශය, සූත්‍ර පිටකය හා මනුස්මෘතිය ආදී ප්‍රාථමික මූලාශ්‍රය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කෙරේ. ඊට අමතරව වේවැල්කැටිය ශිලා ලේඛනය පිළිබඳව ලියැවී ඇති සාහිත්‍ය ග්‍රන්ථ හා ලේඛන පිළිබඳව අවධානය යොමු කිරීමට අපේක්ෂිතය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

### ලංකාවේ පැරණි දඬුවම් ක්‍රම

විජය රජුගෙන් ආරම්භ වන ලංකාවේ දේශපාලන රටාව මහින්දාගමනයත් සමඟ නව දිශාවකට ගමන් කළ බව පෙනේ. සමාජ පාලනය උදෙසා බෞද්ධ ප්‍රතිපත්ති පාලකයා විසින් ක්‍රියාත්මක කළ අයුරු වංසකතා සාහිත්‍යයේ සඳහන් වේ. බෞද්ධ පාලකයා උත්සුක වූයේ වරදට දඬුවම් කිරීමට නොව මිනිසුන් එම වරදට පෙළඹීමට හේතුව සොයා ඊට පිළියම් කිරීමට යි. ''රජ දරුවො වරදට නිග්‍රහ කරන්නාහු ශරීරයේ රෝගයකට වෙදහු කරන පිළියමක් සේ හිත සිතින් කරන්නාහ.........''(EZ 1928: Vol ii, 98-

123) යනුවෙන් නිශ්ශංකමල්ල රජුගේ ගල්පොත සෙල්ලිපියෙහි සඳහන් වේ.එහි දී අවධාරණය කර ඇත්තේ රජු විසින් දඬුවම් නියම කළ යුත්තේ ජන හදවත් පාරවනු පිණිස නොව සුවපත් කරවනු පිණිස බවයි.

### වේවැල්කැටිය ශිලා ලේඛනය

වේවැල්කැටිය ශිලා ලේඛනය වර්ෂ 1875 දී ගෝල්ඩ් ස්මිත් නම් වියතෙකු විසින් සොයා ගන්නා ලදී. මෙය පිහිටුවා ඇත්තේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් කැන්දෑකුලාන නම් ප්‍රදේශයේ ය. මෙම ලිපියට අමතරව මෙහි පිටපත් රාශියක් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් සොයාගෙන තිබේ.

කහටගස්දිගිලිය, වන්නඩිපාලම, මීහොඳවැව, වෙස්සගිරිය, හිගුරක්ගොඩ යන ප්‍රදේශ ඒ අතර වැදගත් වේ. වේවැල්කැටිය ශිලා ලේඛනය පැතලි ගලක් මතුපිට දික් අතට රුල්ගසා පේලි 46ක් කොටා ඇත. එහි උස අඩි 06කි. පළල අඩි 01යි අගල් 02කි.

මෙම සෙල්ලිපිය හතරවන මිහිඳු රජුගේ නව වන රාජ්‍ය කාලයේදී පිහිටුවන ලද්දක් බව ඉසෙඩ් වික්‍රමසිංහගේ මතය යි (පඤ්ඤාසාර හිමි සහ මල්ලව ආරච්චි 2009: 106). නමුත් සිරිමල් රණවැල්ල මහතා එය හතරවන උදය රජුගේ දෙවන රාජ්‍ය වර්ෂයේ දී පිහිට වූ බව ප්‍රකාශ කරයි (ගුණවර්ධන 2013: 38). ''සිරි සඟබෝ අභා'' යනුවෙන් සඳහන් වන්නේ වෙස්සගිරිය ලිපියේ එන '' සිරි සඟබෝ අභා මිහින්දු'' නමින් වූ හතරවන මිහිඳු රජු බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි (EZ 1912: Vol ii, 29). කෙසේ වෙතත් මෙම ලිපිය ක්‍රි.ව. 10 වන සියවසට අයත් බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි.

ශ්‍රී ලංකාවේ පැරණි අපරාධ නීතිය පිළිබඳ සඳහන් මෙම ලිපිය රජුගේ නියෝගයක් මත රාජ සභාවේ '' සම්දරුවන් '' හෙවත් රාජ්‍ය නිළධාරීන් කිහිපදෙනෙකු විසින් ව්‍යවස්ථාගත කර තිබේ. ඒ බව ලිපියේ අවසානයේ දක්වා ඇත්තේ මේ අයුරිනි.''වජාළ එක්තැන් සම්යෙන් ආ රජ් සභායෝ හින්ද්නා ගොළුග් ර(ක්)සා ඉම් තුඩෑ සෙනු ඉසා මෙයිකාප්පර් කුබුර්ගමු ලෝකෝහි ඉසා කැතරි අග්බෝහි ඉසා කුඩසලා අරයන් ඇතුළැවැ.. ''( EZ 1912: Vol i, 241 ) මෙහි අධිකාරි බලයක් හිමි දසගම් සභාවක් පිළිබඳ කියැවේ. මේ පිළිබඳ අදහස් දක්වන ඇතැම් විද්වත්හු දසගම් යනු ආසන්නයේ පිහිටි ගම් දහයක් බවත් ඒවායෙහි වැඩහිටි හෝ නායක ගැමියන් දස දෙනෙකුගෙන් දසගම් සභාව සමන්විත වූ බවත් පවසති. (හැලොගම 2011:141) ලිපියේ අවසන පැන වූ නීති උල්ලංඝනය කරන දසගම ඇත්තන් පිළිබඳ සොයා බලා පරීක්ෂණ සිදුකර ක්‍රියාමාර්ග ගැනීමේ අයිතිය ඉහතින් දක් වූ ඉහළ රාජ්‍ය නිළධාරීන් සතුවන බව දක්වේ. එමගින් අවධාරණය වන කරුණක් වන්නේ ශ්‍රී ලංකාවේ ඉපැරණි අධිකරණ ක්‍රමය මනා අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක වූ බවයි.

### වේවැල්කැටිය ශිලා ලේඛනයේ සඳහන් දඬුවම් ක්‍රම,

නීතිය හා සාමය ආරක්ෂා කරනු වස් එක දඬුවම් ක්‍රම හතරක් ක්‍රියාත්මක කර තිබේ.

- මරණ දඬුවම
- අංග හානි
- දඩ ගෙවීම
- වස්තුව රාජසන්තක කිරීම

### මරණ දඬුවම

වේවැල්කැටිය ශිලා ලේඛනයට අනුව මනුෂ්‍ය ඝාතනයකට හෝ මං කොල්ලකෑමකට සම්බන්ධ වරදකරුවකුට මරණ දඬුවම නියම විය. එහි දී අධිකරණය ක්‍රියා කළ යුතු ආකාරය

අවස්ථා දෙකක් යටතේ පෙන්වා දී තිබේ.''උපන් දූයට පෑ හැකියේ ලියා තබා මැරුවෙහු මරා පට්වනු.......''( EZ 1912: Vol i, 241 )යම් වරදකරුවෙක් පිළිබඳ සිදුකරන නඩු විභාගය පිළිබදව නිරවුල් ව ලියා තැබීම මෙමඟින් අදහස් කෙරේ. ඊට හේතුව වන්නට ඇත්තේ නඩුව පිළිබඳ පසුව ඉදිරිපත් කරන අභියාචනා සළකා බැලීමේ දී පළමු නඩු වාර්තාව පිරික්සීම අනිවාර්ය බැවිනි.

''කඩපළා සොරුන්ගත් අයතියෙන් නියත කළාක් අයිතිය හිමි හට් ගෙන දී එල්වනු.....''( EZ 1912: Vol i, 241 )මෙහි අරුත වන්නේ මං පහරා සොරකම් කළ අයෙක් නඩු තීන්දුවෙන් අනතුරුව නඩු භාණ්ඩ හිමි පුද්ගලයන් හඳුනාගෙන ඔවුන්ට එම භාණ්ඩ ලබා දිය යුතුය යන්නයි. ඉන් අනතුරුව වරද කරුවාට දඬුවම් කළ යුතු වේ. ඊට අමතරව මරණ දඬුවම හිමි තවත් වරදක් ලෙස මී ගවයන් මැරීම පෙන්වා දිය හැකිය .

''මීවුන් ගෙරිගොන් එළුවන් මැරුවන් මරා පට්වනු.......''( EZ 1912: Vol i, 241 )මෙම වැකිය අනුව මී ගවයා,ගෙරි ගවයා හා එළුවා යන සතුන් තිදෙනා මැරීම මරණ දඬුවම හිමි වන වරදකි.

**අංගහානි**

අංගහානි දඬුවම් ක්‍රමය යනු ඉහතින් දැක් වූ සතුන් සොරකම් කළ පුද්ගලයන් විෂයෙහි පණවන දඩ මුදල් ගෙවීමට ඔවුන් අසමත් වන්නේ නම් ඔවුන්ගේ අත් කැපීම සඳහා කරන ලද දඬුවමකි. අපරාධයක් සඳහා උදව් කිරීම, අපරාධකරුවන් සඟවාගෙන සිටීම එවැනි දඬුවම් විදීමට හේතුවිය.''අත් පා වහලට් ගියනකුගෙන් අත් කපා පට්වනු........''( EZ 1912: Vol i, 241 )සතුන් සොරකම් කිරීම නිසා හිමිවන තවත් දඬුවමක් වන්නේ කිසිල්ලෙහි හන ගැසීමයි. ඒ බව ''නොමරා සොරා ගෙනැ ගිය නියත කොට් ඔවුන් කසිලැ සන් ලකුණ් ඔබා '' ( EZ 1912: Vol i, 241 )යනුවෙන් කෙටුම්පත් කොටා තිබේ. කසිල සන් ලකුණු යනු රත් කළ ලෝහයකින් කිසිල්ලෙහි තබන සලකුණකි.

''අනමැකුවන් රත්කළ යමර වැඩියෙ සිට්වනු ......'' ( EZ 1912: Vol i,241)යන පාඨයෙන් උක්ත නීති රීති කඩ කරන ඕනෑම පුද්ගලයකුට හිමිවිය යුතු පොදු නීතියක් නැතිනම් දඬුවමක් පිළිබද කියැවේ.

**දඩ ගෙවීම හා වස්තුව රාජසන්තක කිරීම**

යම් පුද්ගලයෙකුට තුවාල සිදුකළහොත් ඔහුගේ ජිවිතයට අදාළ දිවි මිල ගෙවිය යුතු බව සදහන් වේ.''නොමරා කෙටුව දිවි මිළැ පනස් කලන්දක් රන් ගන්නා කොට් ඉසා '' හා ''අත් පා වහලට් ගියාකුගෙන් දඩ් පනාස් කලන්දක් රන්.......'' ( EZ 1912: Vol i, 241)යනුවෙන් දිවි මිල හා උදව් කිරිම වෙනුවෙන් කලං පනහක රන් රජයට ගෙවිය යුතු බව දක්වයි.

මෙහි සදහන් විශේෂ දඩ ගැසීමේ ක්‍රමයක් වන්නේ යම් වැරදි කරුවකු අල්ලා ගැනීමට දින 45ක් ඇතුළත නොහැකි වුවහොත් ගම් දහයටම පොදු දඩ මුදලක් රජයට ගෙවීමට සිදු වීමයි. ඒ බව, ''තිරැ නොකල දස ගැමැ ඇත්තන් පන්සාලිස් දවසකින් සොයාගෙන ........ සොයා නොගත දස ගැමින් එක්සිය පස්විසි කලන්දක් රන් රදොලට් දෙනු........''( EZ 1912: Vol i, 241) යනුවෙන් සඳහන් කොට තිබේ. යම් වරද කරුවෙකුට නියමවන දඩ මුදල ගෙවාගත නොහැකි වුවහොත් ඔහු සතු වස්තුව රජයට පවරාගත හැකි බව එහි සඳහන් වේ.

**සෙසු කරුණු**

ලංකාවේ අනුරාධපුර යුගයේ අවසාන සමයේ පිහිටුවන ලද මෙම ලිපිය

සමකාලීනව පැවති අධිකරණ හා දඬුවම් ක්‍රියාවලිය පිළිබිඹු කරන්නකි. රජු ඉහළ රාජ්‍යය නිළධාරීන් දසගැමීන් ව්‍යුහාත්මකව බැඳී සිටි අධිකරණ ක්ෂේත්‍රයේ වගකීමේ න්‍යාය පහළ සිට ඉහළට සිදුවිය. දඬුවම මූලික ක්ෂේත්‍රයන් කිහිපයක් යටතේ ගොනුකර තිබීමත් මෙහි ඇති විශේෂ ලක්‍ෂණයකි. ප්‍රජාතාන්ත්‍රික ජීව ගුණාංගයන්ගෙන් සමන්විත ව්‍යවස්ථා පාඨ මෙම ලිපියේ අන්තර්ගතය. සිරිත් විරිත් ඒ අයුරින්ම රැකිය යුතු බව හා ඒවා ඉක්මවා නොයා යා යුතු බව කියැවෙන පාඨයක් ලිපියේ අවසානය වන්නට තිබේ.''දස ගැමැ කුඩින් තමන් තමන් කුලහි වැටෙන මගුලවමගුල බලන්දනා පැරහැර නොඉක්මවනු කොට් ඉසා......''( EZ 1912: Vol i, 241) රජ අණ පමණක් නොව සමාජ කුල සිරිත් ද සමාජයේ ප්‍රගමනයට හේතුවන බව මෙහි දී පිළිගෙන තිබේ.

ඒ අනුව ස්වර්ණමය යුගයක නිමාව වළකනු පිණිස වරින් වර බිහි වූ පාලකයන් උත්සාහ ගත් අයුරු වේවැල්කැටිය ශිලා ලේඛනය මඟින් ප්‍රදර්ශනය වෙයි. ''පෙර සිරිත් සෙ'' යනුවෙන් ලිපියෙහි කිහිප තැනකම යොදා ඇත්තේ එහි කෙටුම් පත් කළ නීති අතීතයේ ද පැවති බැවිනි. එසේ නම් වේවැල්කැටිය ශිලා ලේඛනය උක්ත රාජ්‍යාධිකාරිය තම අභිමතය අනුව පනවන ලද්දක් නොවේ. හමුරාබි ප්‍රඥප්තිය, මනු නීතිය, බෞද්ධ සදාචාර නිර්ණායක පාදක කොටගෙන ප්‍රභවය වූ ශ්‍රී ලංකාවේ රාජ නීතියෙහි දඬුවම දීර්ඝ කාලීන විකාශනයක ප්‍රතිඵලයකි.

### ආශ්‍රිත ග්‍රන්ථ

**මනුස්මෘතිය** (1991) (පරි), පියදාස, නිශ්ශංක. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ.

**මහාවංසය.** (1996) (සංස්), ශ්‍රී සුමංගල හිමි සහ අන්දිරිස් ද සිල්වා බටුවන් තුඩාව. ජාතික කෞතුකාගාර දෙපාර්ත මේන්තුව. කොළඹ.

විමලවංස හිමි, බද්දේගම (1959) **සෙල්ලිපි සමාජය.** නුගේගොඩ අනුල මුද්‍රණාලය.